# යෝජනාව

## DFCC අන්තර්ජාල බැංකුකරණ සේවාව

DFCC BANK
Keep Growing

| | |
|---|---|
| **සුදුසුකම් ලැබීම** | වයස අවුරුදු 18 ට වැඩි වීම |
| **ප්‍රධාන අංග** | DFCC අන්තර්ජාල බැංකුකරණ පහසුකම යනු දවසේ ඕනෑම වේලාවක, ඕනෑම ස්ථානයක සිට ඔබගේ බැංකු කටයුතු ඉතාමත් පහසුවෙන් කළමනාකරණය කරගැනීමට අවස්ථාව සලසා දෙන සේවාවකි. මෙමගින් DFCC Savings Goal පහසුකම, ඉතුරුම් ගිණුම් හා ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම, ක්‍රෙඩිට් කාඩ්පත් අවහිර කිරීම, දැනුම්දීම් (Alerts) සක්‍රීය කිරීම සහ කැමති පරිශීලක නාමයන් (User ID) තෝරාගැනීම වැනි සේවාවන් රාශියක් ලබාගත හැකි වේ. |
| **ප්‍රතිලාභ සහ<br>අගය එකතු කළ සේවාවන්** | **ඔබගේ සියලුම මූලික බැංකු කටයුතු පරීක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම**<br>• ගිණුම් තොරතුරු හා ශේෂයන් පරීක්ෂා කිරීම, බැංකු ප්‍රකාශ හා අවසාන මාස 6ක ගිණුම් විස්තර බාගත කිරීම සහ මුද්‍රණය කිරීම<br>• ණය පහසුකම්, ක්‍රෙඩිට් කාඩ්පත් සහ කල්බදු (ලීසිං) තොරතුරු ලබාගැනීම<br>• DFCC බැංකුව වෙතින් ඔබ ලබාගෙන ඇති සේවාවන් සියල්ලට ඉතාමත් පහසුවෙන් පිවිසීම<br><br>**කාර්යක්ෂම ලෙස ගිණුමකින් ගිණුමට මුදල් මාරු කිරීම සහ ගෙවීම් සිදුකිරීම**<br>• ඔබ සතු ගිණුම්වලට හෝ බාහිර පාර්ශ්වයන් සතු DFCC ගිණුම්වලට ක්ෂණිකව මුදල් මාරු කිරීම<br>• CEFT සහ SLIPS ක්‍රම හරහා වෙනත් බැංකුවල ගිණුම්වලට මුදල් මාරු කිරීම<br>• අන්තර්ජාල බැංකුකරණ පහසුකම හරහා ණය වාරික සහ ක්‍රෙඩිට් කාඩ් බිල්පත් ගෙවීම<br>• අනාගත අවශ්‍යතා සඳහා ඉතාමත් පහසුවෙන් ප්‍රතිලාභීන් නම්කිරීම<br>• රජයේ ආයතන වෙත ගෙවීම් සිදුකිරීම |

**බිල්පත් ගෙවීම**

- ඔබට පහසු ඕනෑම වේලාවක ඕනෑම ස්ථානයක සිට උපයෝගීතා සේවා බිල්පත් ගෙවීම

**අන්තර්ජාලය ඔස්සේ ඉතා පහසුවෙන් ගිණුම් විවෘත කිරීම**

- අන්තර්ජාල බැංකුකරණ පහසුකම හරහා ඉතුරුම් ගිණුම් සහ ස්ථාවර තැන්පතු විවෘත කිරීම
- අන්තර්ජාල බැංකුකරණ පහසුකම හරහා විවෘත කරන ස්ථාවර තැන්පතුවලට 0.5% ක අමතර පොලියක්
- මාර්ගගත ක්‍රමයට විවෘත කළ ස්ථාවර ගිණුම්වල ඇති මුදල්, කල්පිරෙන දිනයට පෙර ආපසු ලබාගැනීමේ හැකියාව
- ඔබේ අනාගත ඉලක්ක ළඟා කරගැනීම පහසු කරවීම සඳහා DFCC Savings Goal පහසුකම භාවිතා කිරීම

**ක්‍රෙඩිට් කාඩ්පත් සේවාවන්**

- ඔබේ ක්‍රෙඩිට් කාඩ්පත අවහිර කිරීම
- විදේශ රටවලදී ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කිරීමට හැකි වීම සඳහා ඔබගේ සංචාරයන් පිළිබඳව බැංකුව දැනුවත් කිරීම
- ක්‍රෙඩිට් කාඩ්පත භාවිතා කිරීමට බලාපොරොත්තු නොවන රටවල් අවහිර කිරීම
- ගනුදෙනු පරීක්ෂා කිරීම (සම්පූර්ණ කරන ලද සහ බිල්පතට ඇතුළත් නොකරන ලද)
- ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම් ප්‍රකාශ (පසුගිය මාස 6 ක කාඩ්පත් ගිණුම් ප්‍රකාශ බාගත කිරීම)
- ගනුදෙනුවලට ආසත්කර ගැනීම සහ ගනුදෙනු පහසු ගෙවීමේ ක්‍රම බවට පරිවර්තනය කිරීම
- ඔබ ලබාගෙන ඇති පහසු ගෙවීමේ ක්‍රමවල තත්වය පරීක්ෂා කිරීම
- ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා ගෙවීම් සිදුකිරීම

DFCC BANK
Keep Growing

| | |
|---|---|
| | **ස්වයං-සේවා විශේෂාංග**<br>• ගිණුම්වලට මුදල් බැර කිරීම් සහ බිල්පත් ගෙවීම් සඳහා ඉදිරියට දින නියම කිරීම හෝ ස්ථාවර නියෝග ලබාදීම<br>• ගෙවීම් තහවුරු කිරීම සඳහා ගනුදෙනුවල ලදුපත් බාගත කිරීම<br>• චෙක්පොත් සඳහා ඉල්ලුම් කිරීම හෝ නිකුත් කළ චෙක්පත් සඳහා ගෙවීම් අත්හිටුවීම<br>• අභ්‍යන්තර පණිවිඩ සේවාව හරහා බැංකුව සමග සුරක්ෂිත ලෙස සන්නිවේදනය කිරීම<br>• ශාඛාවක් වෙත පැමිණීමෙන් තොරව අත්තිකාරම් ආදායම් බදු සහතික බාගත කරගැනීම |
| **අයදුම් කරන ආකාරය** | ඔබ දැනටමත් DFCC බැංකුවේ ගනුදෙනුකරුවෙකු නම් ඔබ කළ යුත්තේ 011 2350000 අංකය ඔස්සේ අපගේ ඇමතුම් මධ්‍යස්ථානය අමතා සේවාවන් සඳහා ලියාපදිංචි වීම පමණි.<br>ඔබ නව ගනුදෙනුකරුවෙකු නම්, ගිණුම සඳහා අයදුම් කරන අවස්ථාවේදී අන්තර්ජාල බැංකුකරණ පහසුකම ලබාගැනීම සඳහා ඔබගේ කැමැත්ත ප්‍රකාශ කරන්න. |
| **ගාස්තු** | වාර්ෂික ගාස්තුවක් අය කෙරේ. විස්තර සඳහා ගාස්තු ලැයිස්තුව බලන්න. |
| **නියමයන් හා කොන්දේසි** | සේවා තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි සඳහා කරුණාකර ඔබට ළඟම පිහිටි DFCC බැංකු ශාඛාවෙන් විමසන්න.<br>නැතිනම් බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.dfcc.lk වෙත පිවිසෙන්න. |

DFCC BANK
Keep Growing

| | |
|---|---|
| **ගිණුමෙහි ගනුදෙනු පිළිබඳ විස්තර සහ විමසීම් සඳහා** | **අමතන්න:** 0112 350 000 (පැය 24 පුරාම සක්‍රීය ක්ෂණික ඇමතුම් අංකය)<br>**විද්‍යුත් ලිපිනය:** care@dfccbank.com<br>ඕනෑම DFCC බැංකු ශාඛාවකින් සහයෝගය ලබා ගත හැකි ය.<br>**ප්‍රතිචාර දැක්වීමේ කාලය:** පැය 24 යි |
| **පැමිණිල්ල විභාග කිරීමේ ක්‍රියා පටිපාටිය** | ඔබේ පැමිණිල්ල වැඩ කරන දින 01 ක් ඇතුළත භාර ගෙන, වැඩ කරන දින 02 ක් ඇතුළත විසඳුම් සෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කෙරෙනු ඇති නමුත්, සමහර ගැටලු සඳහා වැඩි කාලයක් ගත වීමට ද ඉඩ ඇත. සාධාරණ කාලයක් ඇතුළත ඔබේ ගැටළු සඳහා සතුටුදායක ප්‍රතිචාරයක් නොලැබුණේ නම්, කරුණාකර අප ව සම්බන්ධ කර ගන්න.<br><br>විද්‍යුත් තැපෑල: care@dfccbank.com<br>අපගේ ඇමතුම් මධ්‍යස්ථානය: 0112 350 000<br><br>**මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා**<br>The Financial Ombudsman,<br>නො. 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 05<br>**දුරකථන අංකය:** (011) 2 595624<br>**විද්‍යුත් ලිපිනය:** fosril@slnet.k<br>**වෙබ් අඩවිය:** www.financialombudsman.lk<br><br>**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව** (FCRD)<br>https://www.cbsl.gov.lk/en/fcrd |